# දකුණු-දකුණු සහයෝගීතාව පිළිබඳ ජාත්‍යන්තර දිනය

දකුණු-දකුණු සහයෝගීතාව යනු, දකුණේ රටවල් සහ එහි ජනතාව අතර සහයෝගීතාවයේ ප්‍රකාශනයකි. එමගින්, ඔවුන්ගේ ජාතික යහපැවැත්මට, තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ඇතුළුව ජාත්‍යන්තරව එකඟ වූ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට දායක වේ. සැප්තැම්බර් 12 වන දින සමරනු ලබන දකුණු-දකුණු සහයෝගීතාව සඳහා වූ ජාත්‍යන්තර දිනයේ මෙවර තේමාව වන්නේ '**සහයෝගීතාවය, සමානාත්මතාවය සහ හවුල්කාරිත්වය: තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දකුණු-දකුණු සහයෝගීතාවය විවෘත කිරීම**' යන්නයි.
විශේෂයෙන්ම දේශගුණික විපර්යාස වැනි වර්තමාන සංවර්ධන අභියෝගවලට සීමා මායිම් නොමැති නිසා, ඒවාට ඵලදායී විසඳුම් සෙවීමට දේශසීමා සහ සීමා මායිම් හරහා සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ.

## දකුණු-දකුණු සහයෝගීතාවය යටතේ ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ තිරසාර බලශක්ති භාවිතයන් වෙත සංක්‍රමණය වීමේ (TSSC) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ,චීනයේ සහ ඉතියෝපියාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ශ්‍රී ලංකා , චීන සහ ඉතියෝපියා රජයන් සමග එක්ව TSSC හෙවත් දකුණු-දකුණු සහයෝගීතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. දකුණු-දකුණු සහයෝගීතාවය ඔස්සේ තිරසාර බලශක්තිය කෘෂි කර්මාන්තයේ ඵලදායිතාව ඉහල නැන්වීම සඳහා භාවිතා කිරීමට යොමු කිරීම එහි අරමුණයි. 2030 වන විට හරිතාගාර වායු (GHG) විමෝචනය අඩු කිරීමේ ඉලක්ක කරා ළඟා වීමට ශ්‍රී ලංකාවට සහාය වන අතරම ජාත්‍යන්තර සහයෝගීතාව, වැඩිදියුණු කළ සේවා සැපයීම සඳහා බලශක්ති ප්‍රවේශය සහ තිරසාර ඒකාබද්ධ ගොවිතැන් පිළිවෙත් සම්බන්ධ තිරසාර සංවර්ධන අභියෝග අවම කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය කටයුතු කරයි.
ශ්‍රී ලංකාව තවත් බොහෝ රටවල් සමඟ පැරිස් ගිවිසුම වෙනුවෙන් කැපවී ඇත. ශ්‍රී ලංකාවේ කාබන් පියසටහන් අවම වුව ද රට පවතින්නේ ඉතා අවදානම් තත්ත්වයකය. එබැවින්,හරිතාගාර වායු විමෝචනය 14.5% කින් අඩු කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. වසර 2030 වන විට විදුලිබල උත්පාදනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තිය බවට පත්කිරීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ඉලක්ක කර ඇත. ශ්‍රී ලංකාව 2050 වන විට කාබන් නිෂ්ක්‍රීයත්වය වෙත ළඟාවීමට අපේක්ෂා කරන අතර ගල් අඟුරු බලාගාරවල ධාරිතාව වැඩි නොකිරීමට කැපවී සිටී.

## හරිත, නැවුම් සහ තිරසාර නිෂ්පාදන

ජුවලෙක්ස් ඇග්‍රි කුමාරගම පෞද්ගලික සමාගම තණමල්විල පිහිටි අඹ වත්තකි. මෙහි අස්වැන්න නෙලීමෙන් පසු, පලතුරු නැවුම්ව තබා ගැනීම සඳහා සැකසීම සහ ශීතාගාර තුළ ගබඩා කිරීම අවශ්‍ය වේ. එබැවින් ව්‍යාපාරයට එහි දෛනික කටයුතු සඳහා ස්ථාවර විදුලි සැපයුමක් අවශ්‍ය වේ. ජුවලෙක්ස් දිනකට අඹ ගෙඩි 3,000-4,000ක් නෙලා ගන්නා අතර, ඉන් 40%ක් නිසි ලෙස ගබඩා නොකළහොත් අපතේ යයි. සෑම මසකම ආයතනය විදුලිය කිලෝ වොට් පැය 2500ක් භාවිතා කරයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ දකුණු-දකුණු සහයෝගීතා ව්‍යාපෘතිය විසින් මෙම ව්‍යාපාරය සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතාගාර ඒකකයක්, කිලෝ වොට් 10 පැනල් සහ ජනක යන්ත්‍රයක් සඳහා රුපියල් 7,025,500ක් ආයෝජනය කර ඇත. මෙම ආයෝජනය, ව්‍යාපාරයට සෑම මසකම රුපියල් 400,000ක් දක්වා ඉතිරි කර ගැනීමට උපකාර වන අතර නෙළන ලද පලතුරු දින 15ක් දක්වා ගබඩා කිරීමට පහසුකම් සලසයි.

**"ගොවීන් අනාගතයේදී තම ව්‍යාපාර ලාභදායී කර ගැනීම සඳහා සූර්ය බලශක්තිය සඳහා ආයෝජනය කළ යුතුයි" – මේජර් ජෙනරාල් බුවනෙක ගුණරත්න (Jewelex Agri හිමිකරු)**








## කුඩා ව්‍යාපාර තිරසාර බලශක්තියෙන් සවිබලගැන්වීම

මඩහපොළ සෝමරත්න, නිකවල නිලන්ත සහ කන්තලේ සුනිල් යන කුඩා පරිමාණ ගොවීන් පුනර්ජනනීය බලශක්තියට මාරුවීම සඳහා දකුණු-දකුණු සහයෝගීතා ව්‍යාපෘතිය විසින් කරන ලද ආයෝජනයේ ප්‍රතිලාභීන් තිදෙනෙකි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල ජීවත් වන මෙම ගොවීන් දැන් තම වගාවන් හානිකර පළිබෝධකයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සූර්ය බල ඉසින යන්ත්‍ර, සූර්ය උගුල් සහ සූර්ය විකර්ෂක භාවිතා කරති. මෙමගින් පරිසරයට සහ ඔවුන්ගේ භෝගවලට අවම බලපෑමක් ඇති කරන අතරම ඔවුන්ට විශාල මුදලක් හා ශ්‍රමයක් ඉතිරි කරගැනීමට හැකි වී තිබේ. එය ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ ප්‍රජාවන්ට ධනාත්මක ආදර්ශයක් සපයන අතරම සූර්ය බල ශක්තිය භාවිතය වෙත සංක්‍රමණය වීමට ඔවුන් දිරිමත් කරයි.

**"නව ගොවීන් මෙවැනි නව තාක්ෂණයන් සහ තිරසාර බලශක්ති විසඳුම්වලට හුරුපුරුදු විය යුතුය. එය අපේ අස්වැන්න වැඩි කර ගැනීමට උපකාරී වේ. එය ගොවිතැනේ අනාගතයයි" – සුනිල්**

## තිරසර අනාගතයක් උදෙසා

හලාවත, විලතාව ප්‍රදේශයේ පිහිටි කමල් ඉස්සන් ගොවිපළ අක්කර දෙකකට වැඩි වපසරියකින් යුක්ත වන අතර එය ප්‍රමුඛතම ඉස්සන් අපනයන සමාගමකි. කීටයන් ඉස්සන් බවට පත්කිරීමේ ක්‍රියාවලිය සඳහා දළ වශයෙන් මාස 4 සිට 5 දක්වා ගත වන අතර එයට ඉහළ බලශක්තියක් වැය වේ. ඉස්සන් පොකුණුවලට දිනකට අවම වශයෙන් පැය 22ක් වාතාශ්‍රය සැපයිය යුතු අතර ඒ සඳහා ගොවිපළට මසකට රුපියල් මිලියනයකට අධික මුදලක් වැය වේ. කමල් ඉස්සන් ගොවිපළට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වාතන යන්ත්‍ර සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනස විසින් ලබා දී ඇත. මෙමගින් ගොවිපළට පිරිවැය ඉතිරි කර ගැනීමට සහ එහි ලාභය වැඩි කිරීමට පමණක් නොව සමස්ත කර්මාන්තයම පුනර්ජනනීය බලශක්තිය වෙත සංක්‍රමණය කිරීම සඳහා අවස්ථාව ලබාදෙයි.

**"සූර්ය බලශක්තියට මාරුවීමේ ප්‍රතිලාභ මම පෞද්ගලිකව අත් දැක ඇත. විදුලි අර්බුදයකට මුහුණ දී සිටින මේ අවස්ථාවේ, මෙය ලාභදායී විසඳුමක් වී තිබේ. මෙම වෙනස නිසා අපිට සැලකිය යුතු ඉතුරුමක් ඇති කරගෙන ඇති අතර එය අපගේ ගොවිපල සමෘද්ධිමත් කිරීමට උපකාරී විය" – නිමල්**



## ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵල:

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) සහාය ඇතිව, ව්‍යාපෘතිය හරහා බලශක්ති ඉතිරිකිරීම්, සූර්ය PV, ජීව වායු සහ VFD (විචල්‍ය සංඛ්‍යාත ධාවකය) හරිතාගාර වායු අඩු කිරීම අධීක්ෂණය කිරීම සඳහා බලශක්ති දත්ත කළමනාකරණ පද්ධතියක් (EDMS) සංවර්ධනය කරන ලදී.
- දත්ත එකතු කිරීම සහ EDMS යාවත්කාලීන කිරීම සඳහා පළාත් පහ අතර තොරතුරු තාක්ෂණ උපකරණ බෙදා හැර ඇත
- නැගෙනහිර, වයඹ, උතුර, දකුණ සහ ඌව පළාත්වල කෘෂිකාර්මික අංශය සඳහා පළාත් බලශක්ති සැලසුම් පහක් සකස් කර 2023 දී අදාළ පළාත් ප්‍රධානීන් වෙත භාරදීමට නියමිතය.
- විවිධ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ යෙදුම් වර්ග අටක් කාන්තාවන් 80 ක් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් 200 ක් ඇතුළුව ප්‍රතිලාභීන් 233 ක් වෙත ලබාදෙන ලදී.
- SLSEA සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී.

### මෙම ව්‍යාපෘතිය මගින් ලබා දෙන ලද පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ යෙදුම් සහ ඒවායේ ප්‍රතිලාභ පහත දැක්වේ.

#### සූර්ය බලයෙන් ක්‍රියාත්මක ශීතාගාර

- වාර්ෂික බලශක්ති ඉතිරිකිරීම් (විදුලිය): 12,900 KWh
- වාර්ෂික විදුලි පිරිවැය ඉතිරිකිරීම්: රු. 374,000
- වාර්ෂික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම: CO2 ටොන් 7 ට සමාන වේ

#### ඉස්සන් ගොවිපළ සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පැඩල් වාතන යන්ත්‍ර

- වාර්ෂික බලශක්ති ඉතිරිකිරීම් (විදුලිය): 13,680 KWh
- වාර්ෂික විදුලි පිරිවැය ඉතිරිකිරීම්: රු. 360,000
- වාර්ෂික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම: CO2 ටොන් 6.6ට සමාන වේ

#### කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන සඳහා විදුලිබල පද්ධතියට සම්බන්ධ කිලෝ වොට් 3 සූර්ය PV පද්ධති

- වාර්ෂික බලශක්ති ඉතිරිකිරීම් (විදුලිය): 12,300 KWh
- වාර්ෂික විදුලි පිරිවැය ඉතිරිකිරීම්: රු. 360,000
- වාර්ෂික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම: CO2 ටොන් 6.6ට සමාන වේ

#### සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ස්වයංක්‍රීය හරිතාගාර

- වාර්ෂික බලශක්ති ඉතිරිකිරීම් (විදුලිය): 12,900 KWh
- වාර්ෂික විදුලි පිරිවැය ඉතිරිකිරීම්: රු. 374,000
- වාර්ෂික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම: CO2 ටොන් 7ට සමාන වේ

#### විදුලි ජනනය සහිත ජීව වායු පද්ධති

- වාර්ෂික බලශක්ති ඉතිරිකිරීම් (විදුලිය): 15,000 KWh
- වාර්ෂික විදුලි පිරිවැය ඉතිරිකිරීම්: රු. 436,200
- වාර්ෂික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම: CO2 ටොන් 10.3ට සමාන වේ

## සූර්ය බලයෙන් ක්‍රියාත්මක ඉසින යන්ත්‍ර

මෙම ව්‍යාපෘතිය මඟින් 2022 වර්ෂයේදී තෝරාගත් පළාත් 5ක (එක් පළාතකට ගොවීන් 15ක් බැගින්) ගොවීන් 75 දෙනෙකු වෙත සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ඉසින යන්ත්‍ර 75ක් සාර්ථකව ලබා දෙන ලදී. වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ අවශ්‍යතාව සහ හරිතාගාර වායු විමෝචනය අඩු කරන අතරම ඉන්ධන සහ ශ්‍රම පිරිවැය අඩු කිරීම මගින් සමස්ත නිෂ්පාදන වියදම අඩු කිරීමට ඒවා උපකාරී වේ. කාන්තාවන් 10 දෙනෙකු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළුව ප්‍රතිලාභීන් 75 දෙනෙකු සඳහා මෙම යෙදවුම ලබා දී ඇත.

## සූර්ය සත්ව විකර්ෂක යන්ත්‍ර උපකරණ

මෙම ව්‍යාපෘතිය මගින් 2022 වර්ෂයේදී තෝරාගත් පළාත් 5 ක ගොවීන් 75 දෙනෙකුට (එක් පළාතකටම ගොවීන් 15 දෙනෙකු බැගින්) සූර්ය සත්ව විකර්ෂක යන්ත්‍ර 75 ක් සාර්ථකව ගොවීන්ට ලබා දෙන ලදී. මිනිසුන්ට, සතුන්ට සහ පරිසරයට අඩු බලපෑමක් සහිතව වගා හානි අවම කිරීමට උදව් වන මෙම උපකරණය කාන්තාවන් 12 දෙනෙකු ඇතුළුව ප්‍රදේශයේ ගොවීන් 75 දෙනෙකුට ලබා දී ඇත.

## සූර්ය බලයෙන් ක්‍රියාත්මක කෘමි උගුල්

මෙම ව්‍යාපෘතිය මඟින් 2022 වර්ෂයේදී තෝරාගත් පළාත් 5ක (එක් පළාතකටම ගොවීන් 15ක් බැගින්) ගොවීන් 75 දෙනෙකු වෙත සූර්ය කෘමි උගුල් 75ක් සාර්ථකව ලබා දෙන ලදී. මෙම සූර්ය කෘමි උගුල් භාවිතා කිරීමෙන් පලිබෝධ නාශක සඳහා වැයවන පිරිවැය අඩුවීමත්, , ශ්‍රමය අඩු වීමත් නිෂ්පාදන පිරිවැය අඩු වීමත්, එමගින් ඵලදායිතාව වැඩි වී වාර්ෂික ආදායම වැඩි කරයි. මෙම යෙදවුම කාන්තාවන් 14ක් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළුව ප්‍රතිලාභීන් 75ක් වෙත ලබා දෙන ලදී.

**දකුණු-දකුණු සහයෝගීතාවය යටතේ ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ තිරසාර බලශක්ති භාවිතයන් වෙත සංක්‍රමණය වීමේ (TSSC) ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ, චීනයේ සහ ඉතියෝපියා රජයන්ගේ සහ එම රටවල එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ඒකාබද්ධ ප්‍රයත්නයකි.**

UNDP